**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
---------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් සඳහා රු. 47,857 ක් වැඩියෙන් ප්‍රතිපාදන සලසා තිබූ අතර රු. 46,059 ක් වූ වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් විවිධ තැන්පත්, ඉඩම් හා ගොඩනැගිලි සහ වියදම් ණයහිමියෝ යන ගිණුම් විෂයයන් 03 ක ශේෂ සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂ අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 516,947 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

i. 2011 වර්ෂයේ සිට අයවිය යුතු කර්මාන්ත ආධාර වල එකතුව රු. 9,419,864 ක් වූ අතර එම මුදල සමාලෝචිත වර්ෂයේදීද අයකර ගෙන නොතිබුණි.

ii. 2013 වර්ෂයේ සිට අයවිය යුතු එකතුව රු. 1,175,689 ක් වූ වාහන කුලී ආදායම් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගෙන නොතිබුණි.

iii. 1997 – 2000 වර්ෂවලට අදාළව තංගල්ල දිසා අධිකරණයේ නඩු පවරා තිබුණු එකතුව රු. 519,632 ක් වූ පොළ බදු සහ සේවක ණය මුදල් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

i. බැකෝ යන්ත්‍රය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබා ගෙන තිබුණු රුපියල් මිලියන 08 ක ණය මුදලින් 2012 වර්ෂය සඳහා ගෙවිය යුතු එකතුව රු. 752,511 ක ණය වාරික සහ පොලිය සමාලෝචිත වර්ෂයේදීත් ගෙවීමට පියවර ගෙන නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 21,911,377 ක් වූ ණයහිමි ශේෂය තුළ 2011 සිට 2015 වර්ෂය දක්වා එකතුව රු. 4,702,025 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ සහ එකතුව රු. 5,389,823 ක් වූ වියදම් ණයහිමි ශේෂ ඇතුළත් වි තිබුණි. තවද මෙම වියදම් ණයහිමි ශේෂ තුළ දිගින් දිගටම නිරවුල් නොවී පවතින රු. 4,942,100 ක් වූ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට ගෙවිය යුතු වියදමක්ද ඇතුළත්ව තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**------------------------------------**

එකතුව රු. 247,838,588 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත සහ ලී බඩු හා සවිකිරීම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන, රු. 16,968,087 ක් වූ දේශීය ණය සංවර්ධන අරමුදලට අදාළ ශේෂ සනාථන ලිපි, රු. 13,936,026 ක් වූ විවිධ තැන්පතු වලට අදාළ යාවත්කාලීන කරන ලද තැන්පතු ලේඛනය, රු. 1,040,799 ක් වූ හිඟ වාහන කුලී මුදල් වලට අදාළ උපයෝගී ලේඛන සහ කාල විශ්ලේෂණය, රු. 519,632 ක් වූ නඩු පැවරීම් මගින් අයවිය යුතු මුදල් වලට අදාළ නඩු ලේඛනය, රු. 120,652 ක් වූ ක්ෂේත්‍ර ගබඩා තොග උපලේඛනය යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය** | |
| 193 රීතිය | අයවැයගත ප්‍රතිපාදන හා පරිපූරක සම්මත සමග සසඳා එක් එක් ආදායම් විෂයයන් හා වැය විෂයන් යටතේ වන අතිරික්තයන් හෝ ඌණතාවයන් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 571(3) | තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු. 847,542 ක් වූ තැන්පතු ශේෂ 51 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන් 19 දෙනෙකු විසින් ඇප තබා නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | සභාව සතු වාහන 12 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 9,555,250 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 2,189,127 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 7,366,123 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 85 ක් තරම් ඉහළ අගයක පුනරාවර්තන වියදම් පැවති අතර, එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණ විය.

(ආ) සෑම වර්ෂයකම ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් දරා ඇති බවත්, ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත් වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොමැති බවත් පෙන්නුම් කෙරුණි.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 4 ත් වර්ෂ 5 අතර කාලයක සිට අයනොවී පවතින කර්මාන්ත ආධාර හා වාහන කුලී ශේෂ වල එකතුව රු. 10,595,553 ක් වීමෙන් ජංගම හා ක්ෂණික අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

**2.4 ආදායම් පරිපාලනය**

--------------------

**2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ බිල් කළ මුළු පුනරාවර්තන ආදායම රු. මිලියන 37.98 ක් වූ අතර, එයින් රු. මිලියන 21.05ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 55 ක් පමණ විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් වල එකතුව රු. මිලියන 24.58 ක් වූ අතර, එයින් රු. මිලියන 11.73 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සියයට 48 ක් පමණ විය.

**2.4.2 වරිපනම් බදු**

-------------

ආරම්භක හිඟයෙන් සියයට 41 ක් හා වර්ෂයේ බිල් කිරීම්වලින් සියයට 77 ක් අයකර ගෙන තිබුණි. කෙසේ වුවද වර්ෂය අවසානයට හිඟ ශේෂය රු. 1,336,870 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. හිඟ බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.4.3** බදු කුලී

--------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු. 2,562,149 ක් වූ ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 26 පමණක් අයවීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු. 2,576,789 ක් විය. හිඟ කුලී අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 27 දිනැති, අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන පහත දැක්වෙන අවස්ථා වලදී අනුගමනය කර නොතිබුණි.

i. බණ්ඩරවත්ත පොදු වෙළඳපොළෙහි කඩ කාමර 20 ක් හා පුස්තකාල සායන ගොඩනැගිල්ලේ පිහිටි කඩ කාමර 25 ක් බදුදීමේදී චක්‍රලේඛයේ අංක 01 ඡේදයට අනුව කටයුතු කර නොතිබුණි.

ii. නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 30 ක්, නව කාර්යාලීය ගොඩනැගිල්ලේ කඩකාමර 10 ක් සහ බණ්ඩරවත්ත පොදු වෙළඳපොළ කාමර 20 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර වසර 03 කට වරක් ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

iii. චක්‍රලේඛයේ 04 ඡේදයේ දැක්වෙන පරිදි එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු එක්වන් මුදල් වල එකතුව රු. 12,342,266 ක් විය. 2017 ජූලි 31 වන විට එම මුදලින් කඩ කාමර 17 ක් සඳහා රු. 2,579,600 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

iv. චක්‍රලේඛයේ අංක 02 හා අංක 04 ඡේද වල දැක්වෙන විධිවිධාන අනුගමනය කර බණ්ඩරවත්ත පොදු වෙළඳපොළ කඩකාමර බදු දීමට 2017 ජූලි 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

**2.4.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 389,129 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 12,919,101 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත දෙකක් සඳහා රු. 1,350,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම - 2016 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පොදු ළිඳක් ඉදිකිරීම වෙනුවෙන් රු. 150,000 ක මුදලක් 2017 ජනවාරි මාසය තුළ සභාවට ලැබී තිබුණද, 2017 ජූලි 31 දින වන විටත් ව්‍යාපෘතියෙහි වැඩ ආරම්භ කර නොතිබුණි.

(ඇ) ඇස්තමේන්තුගත මුදල රු. 620,000 ක් වූ ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 333,050 ක මුදලක් වියදම් කර තිබූ නමුත් ඉන් ව්‍යාපෘති 02 ක් 2017 ජූලි 31 දින වන විටත් නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂ 01 සිට වර්ෂ 04 ක් දක්වා කාලයක සිට භාවිතයෙන් ඉවත් කර තිබුණු විවිධ වත්කම් ඒකක 11 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) පිරිවැය රු. 4,455,200 ක් වූ සභාව සතු වාහන 03 ක් වර්ෂ 01 සිට 03 දක්වා කාලයක් ප්‍රයෝජනයට නොගෙන ගර්හිතව පැවතුණි.

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2014 නොවැම්බර් 13 දින ලැබී ප්‍රාදේශීය සභාවේ ඉන්වෙන්ට්‍රි ගත කර තිබුණු කොඩි කණු 600 කින් කොඩිකණු 279 ක් සභාව භාරයේ නොතිබුණි.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2013 අයවැය යෝජනා මගින් ක්‍රියාත්මක වූ දිළිඳුකම අවම කිරීමේ සංවර්ධන වැඩසටහන යටතේ ලබාදී ඇති ආවරණ කූටි 10 ක් ඉන්වෙන්ට්රි ගතකර නොතිබුණු අතර, 2017 ජූලි 31 දිනවන විටත් ඉන් ආවරණ කූටි 04 ක් සභාව භාරයේ නොතිබුණි.

**3.4 වාහන පාලනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු වාහන 09 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රද, ඉන් වාහන 05 ක් සඳහා වාර්ෂික රක්ෂණ ආවරණයක්ද ලබාගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් භාවිතා කරන වාහන 12 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2016 යටතේ විවෘත කොම්පෝස්ට් අංගනයක්, කාණු පද්ධතියක් හා ජල ගබඩා ටැංකියක් ඉදිකිරීමට අදාළ ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 03 යටතේ ගෙබිම කොන්ක්‍රීට් කිරීමේදී ඉටු නොකළ වැඩ ඝණ මීටර් 12.95 ක් සඳහා රු. 191,051 ක වැඩිපුර ගෙවීම් සිදුවී තිබුණි.

(ආ) උක්ත කර්මාන්තයට අදාළ ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 15,16,17,18 සහ 19 යන වැඩ විෂයයන් නිමකර නොතිබුණු නමුත්, ඒ වෙනුවෙන් රු. 15,921 ක මුදලක් ගෙවා තිබුණි.

## 3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කොම්පෝස්ට් අලෙවියෙන් රු. 149,320 ක ආදායමක් උපයාගෙන තිබුණු නමුත්, කසළ බදු පනවා වියදම් ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් පහත දැක්වෙන නියමයන් හා කොන්දේසි සම්පූර්ණ කර නොතිබුණි.

i. කාබනික පොහොර නිපදවීම සඳහා යොදාගත නොහැකි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි වෙනත් ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා යොදවා ගැනීම.

ii. ප්‍රමාණවත් ගිණි නිවීමේ උපකරණ හා පහසුකම් ක්‍රියාවලි භූමියේ ස්ථාපිත කිරීම.

iii. කොම්පෝස්ට් නිෂ්පාදන පරිශ්‍රය තුළ මනා ගෘහපාලනයක් පවත්වා ගැනීම.

## 3.7 කාර්ය මණ්ඩල කළමනාකරණය

----------------------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට අනුමත කාර්යය මණ්ඩලයට අයත් තනතුරු 10 ක 39 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 06 ක 10 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**4.1 අයවැය පාලනය**

---

වියදම් විෂයයන් 06 ක රු. 14,762,607 ක් වූ ඉතිරිවීම්ද, ආදායම් විෂයයන් 02 ක ළඟා කර නොගත් රු. 7,243,099 ක ඉලක්කයන්ද නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

**5. පද්ධති හා පාලන**

---

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය